# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# University of Sri Jayewardenepura
## බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
## External Degrees and Extension Courses Unit

| | | | |
|---|---|---|---|
| මගේ අංකය My Number | USJP/BA/EEX-15 | ලිපිනය Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල Post Box 10, Gangodawila |
| ඔබේ අංකය Your Number | | | නුගේගොඩ, ශ්‍රී ලංකා Nugegoda, Sri Lanka , |
| දුරකථනය Telephone | 011-2801481, 011-3132496 011-2758233 | වෙබ් අඩවිය Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස් Fax | 011-2802753 | විද්‍යුත් තැපෑල E-mail | ext.certi@sjp.ac.lk |


2025-05-14

ගරු ස්වාමීන් වහන්ස/ මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනවියනි

## 2024 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව - පාඨමාලා ගාස්තු දෙවන වාරිකය ගෙවීමේ කාලය දීර්ඝ කිරීම

උක්ත උපාධි පාඨමාලාවේ දෙවන වාරිකය ගෙවීම **2025-05-30** දින දක්වා පමණක් දීර්ඝ කර ඇති අතර නැවත එම කාලසීමාව කිසිඳු හේතුවක් මත දීර්ඝ කරනු නොලබන බවද වැඩිදුරටත් දන්වමි.

2024 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණය පැවැත්වීමට අදාළ අයදුම්පත් කැඳවීමේදී ඒ සඳහා අයදුම් කිරීමට ඔබ විසින් මෙම ගෙවීම් සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම විභාග ප්‍රවේශපත් නිකුත් කරනු ලබන්නේ වාරික ගෙවා සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ට පමණි.

| | |
|---|---|
| **පාඨමාලා ගාස්තු දෙවන වාරිකය ගෙවිය යුතු ගිණුම් අංකය** | දෙවන වාරිකය සඳහා ගිණුම් අංක ලබා ගත යුතු අතර **www.external.sjp.ac.lk** යන වෙබ් අඩවියට පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය "v" අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කර ගත හැක. |
| **පාඨමාලා ගාස්තු දෙවන වාරිකය**<br>**දෙවන වාරිකය** සඳහා මුදල් ගෙවිය යුතු අවසන් දිනය | **රු. 75,000.00**<br>**2025-05-30 දක්වා දීර්ඝ කර ඇත.** |
| **අයදුම්පත් යොමු කළ යුතු ආකාරය** | සම්පූර්ණ කරන ලද අයදුම්පත හා රිසිට්පත්වල පැහැදිලි පිටපත් (Scanned Copy) අදාළ දිනට පෙර reg.edecu@sjp.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය. (අදාළ ලේඛන විද්‍යුත් ලිපිනයට යොමු කිරීමේදී **2024 BA (General) External Degree – 2nd installment – Reg. No** (ඔබගේ ලියාපදිංචි අංකය) ලෙස සඳහන් කර එවීම අනිවාර්ය වේ.) |

**ඔබගේ විශේෂ අවධානයට:**

1. පාඨමාලා ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. **වෙනත් ගිණුම් අංකවලට ගෙවනු ලබන මුදල් පිළිබඳ විශ්වවිද්‍යාලය විසින් වගකියනු නොලබන බව කරුණාවෙන් සළකන්න. (එහි ඡායාපිටපතක් ළග තබා ගත යුතුය).**

2. **විද්‍යුත් තැපැල් ලිපිනයට ප්‍රමාදවී ලැබෙන අයදුම්පත්, නියමිත පරිදි මුදල් නොගෙවන ලද අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය